## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක / නිලධාරි

## වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය

**01 හැඳින්වීම**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009/02/20 දිනැති අංක 1589/30 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති හි 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක / නිලධාරි සඳහා වන ස්ථාන මාරු පරිපාටිය සැලකිල්ලට ගනිමින් වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය විසින් ස්ථාන මාරුවීම් සිදු කරනු ලැබේ. වාර්ෂික ස්ථාන මාරු සෑම වර්ෂයකම ජනවාරි මස පළමුවන දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වේ.

**02 වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර**

මේ පරිපාටියේ නිලධාරීන් යන්නෙන්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III,II,I ශ්‍රේණියේ නිලධාරීන් යන සියළු දෙනාම අදහස් වේ. එසේම නිලධාරියාගේ පත්වීම් දිනය යන්නෙන් අදහස් වනුයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට (පැරණි සේවා ව්‍යවස්ථාව අනුව II "ආ" ඛණ්ඩයට) පත්වූ දිනයයි.

2.1 සේවා ස්ථාන වර්ගීකරණය

(a) ඉතා ගිනකර - කොළඹ, කටුනායක, කටුගස්තොට, ගාල්ල, අනුරාධපුරය, කුරුණෑගල

(b) ගිනකර - මඩකලපුව, රත්මලාන, පුත්තලම, නුවරඑළිය, රත්නපුර, බණ්ඩාරවෙල, බදුල්ල සහ හම්බන්තොට

(c) දුෂ්කර - යාපනය, පොතුවිල්, මන්නාරම, වව්නියාව, මහඉලුප්පල්ලම, මත්තල, මොණරාගල, ත්‍රිකුණාමලය, පොළොන්නරුව

2.2 වාර්ෂික ස්ථාන මාරුවකදී එක් කාර්යාලයක සේවය කළ යුතු සාමාන්‍ය / උපරිම සේවා කාලය අවුරුදු 04ක් වන අතර එක් එක් කාර්යාලයන්හි සේවය කළ යුතු අවම කාලය වන්නේ

(a) ඉතා ගිනකර - අවුරුදු 04

(b) ගිනකර - අවුරුදු 03

(c) දුෂ්කර - අවුරුදු 02

**03 වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

(i) අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ - මණ්ඩලයේ සභාපති පදවිය

(ii) නියෝජ්‍ය අධ්‍යක්ෂ / කාලගුණ විද්‍යාඥ / සහකාර අධ්‍යක්ෂ - සාමාජික

(iii) එක් එක් තනතුරෙහි වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් නිලධාරි සංඛ්‍යාවෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් - සාමාජික

(iv) පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදා හැර ඇති එක් එක් වෘත්තීය සංගමයේ නියෝජිතයෙකු - සාමාජික



ජී.කේ. කරුණානායක
අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**04 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

(i) අධ්‍යක්ෂ - සභාපති

(ii) නියෝජ්‍ය අධ්‍යක්ෂ - සාමාජික

(iii) කාලගුණ විද්‍යාඥ / සහකාර අධ්‍යක්ෂ - සාමාජික

**05 වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු**

5.1 මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී සේවා අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

5.1.1 වාර්ෂික ස්ථාන මාරු ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය.

5.1.2 වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී සේවා කාලය ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධාරියාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු සමාලෝචන කමිටුව ඒ පිළිබඳ සැලකිල්ල යොමු කරයි.

5.1.3 ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී සලකා බලනු ලබන්නේ ආකෘති පත්‍රයට අනුව සකස් කළ අයදුම්පත් පිළිබඳ පමණි.

5.1.4 සෑම විටම නිලධාරියෙකුගේ පළමු කැමැත්ත සහිත සේවා ස්ථානයට ස්ථාන මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දරනු ලැබේ. පළමු කැමැත්ත නොලැබූ නිලධාරියෙකුගේ දෙවන කැමැත්ත පළමු කැමැත්ත ලෙස සලකා ඒ අනුව ස්ථාන මාරුවීම ලබා දීමට උත්සාහ දරනු ලැබේ. දෙවන කැමැත්ත සහිත සේවා ස්ථානයටද ස්ථාන මාරුවීම ලබා දීමට නොහැකිවන නිලධාරින්ගේ තුන්වන කැමැත්ත පළමු කැමැත්ත ලෙස සලකනු ලැබේ.

5.2 නිලධාරියෙකුගේ වයස පවත්නා වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට අවුරුදු 57 සම්පූර්ණ වන්නේ නම්, ඔහුගේ හෝ ඇයගේ ඉල්ලීමකින් තොරව ස්ථාන මාරු සිදු කරනු නොලැබේ.

5.2.1 දුෂ්කර සේවා ස්ථානයක සේවය කරනු ලබන නිලධාරින් හෝ නිලධාරිනියන් හට සෑම අවස්ථාවකම ඔහුගේ / ඇයගේ මනාප ස්ථාන ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දරනු ලැබේ. ඉතා හිතකර හෝ හිතකර සේවා ස්ථානයන්හි සේවය කරනු ලබන නිලධාරින්ගේ ඉතා හිතකර හෝ හිතකර සේවා ස්ථානයකට කරනු ලබන ඉල්ලීම් සලකා බලනු ලබන්නේ එම සේවා ස්ථාන වලට දුෂ්කර සේවා ස්ථානයන්හි සේවය කරනු ලබන නිලධාරින්ගේ ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

ඒ.කේ. කරුණානායක
අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

5.3 <u>සේවා ස්ථාන ලබා දීමේ පරිපාටිය</u>

5.3.1 යම් සේවා ස්ථානයක නියමිත සේවා කාලය අසම්පූර්ණ නිලධාරියෙකු වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරුවීමක් ඉල්ලන්නේ නම් එය සලකා බලනු ලබන්නේ එම දෙවැනි ස්ථානය සඳහා නියමිත සේවා කාලය සම්පූර්ණ වූ නිලධාරියෙකුගේ ඉල්ලීමක් නොමැති විට පමණි. තවද ඉහත සේවා කාලය අසම්පූර්ණ වූ නිලධාරියෙකුගේ ඉල්ලීම සලකනුයේ එම දෙවැනි සේවා ස්ථානයේ පුරප්පාඩුවක් ඇති වුවහොත් මෙන්ම එම නිලධාරියාගේ සේවා ස්ථානයේ සේවය සඳහා යම් නිලධාරියෙක් ඉල්ලුම් කර ඇත්නම් පමණි. සේවා කාලය අසම්පූර්ණව ස්ථාන මාරු ඉල්ලනු ලබන නිලධාරියා වෙනුවෙන් එම දෙවැනි සේවා ස්ථානයේ නියමිත සේවා කාලය හෝ ඊට වඩා වැඩි කාලයක් ඇති නිලධාරියා ඉවත් නොකරනු ඇත. කෙසේ වෙතත් සේවා අසම්පූර්ණ නිලධාරියාගේ එම සේවා කාලය අඩු වූයේ දෙපාර්තමේන්තු අවශ්‍යතාවයක් ඉටුවීම සඳහා වේ නම් හා සේවා කාලය එම සේවා ස්ථානයට නියමිත අවම සේවා කාලයෙන් මාස 06ක් හෝ ඊට අඩු කාලයකදී නම් එම දෙවැනි ස්ථානයේ සේවය සම්පූර්ණ වූ නිලධාරියා පිටතට මාරු කරනු ඇත.

5.3.2 කිසියම් සේවා ස්ථානයක නියමිත කාලය සම්පූර්ණ වී ඇති නිලධාරියෙකු වෙනත් සේවා ස්ථානයකට මාරුවීමක් ඉල්ලා ඇති විටක එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එම දෙවැනි සේවා ස්ථානයේ අවුරුදු 04ක සේවා කාලයට වැඩි හෝ අවුරුදු 04ක සේවා කාලයක් සහිත නිලධාරින් අනුපිළිවෙලින් ඉන් පිටතට මාරු කරනු ඇත.

5.3.3 මෙතෙක් සඳහන් කළ වගන්ති ප්‍රකාර ප්‍රමුඛත්වයක් නොලැබී එකම සේවා ස්ථානයක් සඳහා නිලධාරින් වැඩි ප්‍රමාණයක් ඉල්ලුම් කර ඇති විට පමණක්, ඔවුන් අතරින් වඩාත් සුදුසු නිලධාරියා තෝරා ගැනීමට පහත සඳහන් ප්‍රමුඛත්වයන් සපුරන්නා වූ අනුපිළිවෙල උපයෝගී කර ගනු ඇත.

I. යම් නිලධාරියෙකුගේ හෝ නිලධාරිනියකගේ කලත්‍රයා, ඉල්ලුම් කරන සේවා ස්ථානය අයත් දිස්ත්‍රික්කය තුළ හෝ යාබද දිස්ත්‍රික්ක තුළ රාජ්‍ය සේවයේ නිරත වීම.

II. නිලධාරියාගේ පෙර සේවා කාලය තුළ ඉල්ලුම් කරන ස්ථානයේ සේවය කර නොතිබීම හෝ සේවය කරන ලද වසර ගණන අවම වීම. (දෙපාර්තමේන්තුව තුළ පුහුණු කාලය හැර තම සේවා කාලය වසර 07ක් හෝ ඊට අඩු නම් එය ප්‍රමුඛතාවයක් ලෙස නොසැලකේ.)

III. ඉල්ලුම් කරන සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ හෝ යාබද දිස්ත්‍රික්කයක ඇති පාසල්වල ඉගෙනුම ලබන දරුවන් ඇති නිලධාරින් වීම.

IV. නිලධාරියාගේ පෙර සේවා කාලය තුල දුෂ්කර ස්ථානවල සේවා කාල සමාන නම් ඉන් අඛණ්ඩ සේවා කාලය වැඩි නිලධාරියාට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

මෙම ප්‍රතිලාභය ලබාදෙනු ලබන්නේ ඉහත කරුණු වැඩි ප්‍රමාණයක් සපුරාලීමට නොව ප්‍රමුඛතාවය මතවේ. එසේ වුවද මෙම වගන්තිය (5.3.3) යටතේ යම්කිසි සේවා ස්ථානයකට නැවත වරක් ස්ථාන මාරුවක් ලැබීමට සුදුසුකම් ලබන්නේ එකිනෙකට වෙනස් වෙනත් සේවා ස්ථානවල ගතකළ ඊට අනුයාත "සාමාන්‍ය සේවා කාල දෙකක් " වන අවුරුදු අටක (8) කාලයකට පසුව පමණි.



ජේ.කේ. කරුණානායක
අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

5.3.4 පළමු පත්වීම ලැබූ හෝ අවු: 02 පුහුණු කාලය අවසන් කළ කාලගුණ විද්‍යා නිරීක්ෂක / සන්නිවේදක නිලධාරියෙකු හෝ නිලධාරිනියක් තමාගේ පළමු ස්ථාන මාරුවීම දෙපාර්තමේන්තු අවශ්‍යතාවය මත තීරණය කරනු ලැබීමට යටත්වනු ඇත. තවද, යම් නවක නිලධාරීන් කණ්ඩායමක් ස්ථාන මාරු කිරීමේදී ජ්‍යෙෂ්ඨත්වයේ පහළ සිට ඉහළට යන අනුපිළිවෙලට ස්ථාන මාරු කිරීම කරනු ලැබේ. ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත වී ඇති, පුහුණුවෙන් පසු වසර 04ක් සම්පූර්ණ කළ එහෙත් පළමු ස්ථාන මාරුවීම් නොලැබූ නවක නිලධාරියෙකු හෝ නිලධාරිනියක වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලා සිටීමට සුදුසුකම් ලබනු ඇත. නවක නිරීක්ෂක කණ්ඩායමක් පුහුණුවෙන් පසු ස්ථාන මාරු කරනුයේ ඊට කලින් පුහුණුව ලැබූ නිරීක්ෂක කණ්ඩායමේ සියලුම නිලධාරි / නිලධාරිනීන් ඔවුන්ගේ ප්‍රථම ස්ථාන මාරුවීම ලැබීමෙන් පසුව වේ. යම් නිලධාරියෙක් හෝ නිලධාරිනියක් තාවකාලික පදනම මත අනුයුක්ත කිරීම එම නිලධාරියාගේ හෝ නිලධාරිනියගේ පළමු ස්ථාන මාරුවීම නොවනු ඇත. කෙසේ වෙතත් වසර 02ක් හෝ ඊට වැඩි කාලයක් තාවකාලිකව අනුයුක්ත කරනු ලැබූ මෙවැනි නිලධාරියෙකුගේ හෝ නිලධාරිනියකගේ තාවකාලික අනුයුක්තය ස්ථිර ස්ථාන මාරුවීමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

5.3.5 වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් විශේෂ කරුණු

5.3.5.1 දෙපාර්තමේන්තුවේ සෑම අංශයක්ම සහ ගුවන්තොටුපළ (කටුනායක , රත්මලාන හා මත්තල) කාලගුණ විද්‍යා කාර්යාලවල සේවය සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් නොමැති සහ ස්ථාන මාරු කළ නොහැකි අවස්ථාවලදී විශේෂ ශ්‍රේණිය සඳහා සුදුසුකම්ලත් I ශ්‍රේණියේ නිලධාරියෙකු ද එම ස්ථානවල සේවයේ නොමැති නම් ද අදාළ සුදුසුකම් සහිත නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු මගින් සුදුසුකම් ලබා නොමැතිනම් ද වෙනත් ප්‍රාදේශීය කාර්යාලයක සේවය කරන විශේෂ ශ්‍රේණිය සඳහා සුදුසුකම් ලත් I ශ්‍රේණියේ නිලධාරියෙකු එම කාර්යාලවලට ස්ථාන මාරු කරනු ලැබේ.

5.3.5.2 විශේෂ ශ්‍රේණියේ හෝ විශේෂ ශ්‍රේණිය සඳහා සුදුසුකම්ලත් I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් ඉහත තනතුරු සියල්ල පිරවූ පසු අනෙකුත් සෑම ප්‍රාදේශීය කාර්යාලයක්ම ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ පවතින පරිදි වාර්ෂික ස්ථාන මාරුවීම් සිදු කරනු ලැබේ. එසේ නොමැති විට I ශ්‍රේණිය සඳහා සුදුසුකම්ලත් නිලධාරියෙකු එම ප්‍රාදේශීය කාර්යාලයේ ස්ථාන භාර නිලධාරි ලෙස පත් කළ හැකිය.

5.3.5.3 ප්‍රධාන කාර්යාලයේ ශාඛා සියල්ලටම කාර්ය භාර නිලධාරිට අමතරව අවම වශයෙන් එක් නිලධාරියෙකුවත් සිටින ලෙස I ශ්‍රේණියේ ඉතිරි නිලධාරීන් 5.1 ඡේදයට යටත්ව එම කාර්යාලවලට ස්ථාන මාරු කරනු ලැබේ. එසේ නොමැති විට I ශ්‍රේණිය සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් එම කාර්යාලවලට ස්ථාන මාරු කරනු ලැබේ.

5.3.6 සෑම ස්ථාන මාරු නියෝගයක්ම ක්‍රියාත්මක වන්නේ එක් එක් වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිටය.

ඒ.කේ. කරුණානායක
අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

5.3.7 යම් සේවා ස්ථානයක අවුරුදු 04කට වඩා වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් වෙනත් අයදුම්කරුවන්ගේ ඉල්ලීම් ඉටු කිරීමට හෝ වෙනත් බාහිර කාර්යාලයක ඇතිවන පුරප්පාඩුවක් සම්පූර්ණ කිරීමට හෝ හැකිවන සේ ස්ථාන මාරුවීම්වලට යටත් විය හැකි බැවින් එවැනි නිලධාරීන් මාරුවීමක් ලබා ගැනීමට අකමැති වුවද මාරුවීමට කැමති ස්ථාන 03ක් ඉල්ලුම් පත්‍රයේ අදාළ ස්ථානයේ සඳහන් කර ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. (දැනට සිටින ස්ථානයේ තවදුරටත් රැඳී සිටීමට අවශ්‍ය නම් ඒ බව අයදුම් පත්‍රයේ අදාල ස්ථානයේ සඳහන් කළ යුතුය.)

එලෙස වර්තමාන සේවා ස්ථානයම නැවත ඉල්ලා සිටින නිලධාරීන්ට එය ලබා දෙනු ලබන්නේ මෙම ඡේදයේ ඉහතින් සඳහන් අවශ්‍යතාවන්ට යටත්වය.

එසේ වර්තමාන සේවා ස්ථානයම ලබා දෙනු ලබන්නේ එක් වසරක කාලයක් සඳහා පමණක් බලපැවැත්වෙන පරිදි වේ. එබැවින් තවදුරටත් එම ස්ථානයේ රැඳී සිටීමට බලාපොරොත්තු වන නිලධාරීන් වසරක් පාසා නැවත, නැවත ඉල්ලුම් කළ යුතුය.

5.3.8 කිසිදු නිලධාරියෙකු මාරුවීමක් නොඉල්ලා ඇති සේවා ස්ථානයක පුරප්පාඩුවක් ඇති වූ විට

(1) ප්‍රධාන කාර්යාලයේ හෝ වෙනත් සේවා ස්ථානයක නියමිත සේවා කාලය ඉක්මවා එහෙත් කිසිදු ස්ථාන මාරු වීමක් ඉල්ලා නොමැති නිලධාරීන්

(2) ස්ථාන මාරු වීමක් ඉල්ලා සිටි එහෙත් ස්ථාන මාරු පරිපාටියට අනුව එම කිසිදු ස්ථානයක් ලබා දීමට නොහැකි වූ නිලධාරීන්

(3) එම සේවා ස්ථානය සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී සමාන සුදුසුකම් ඇති නිලධාරීන් ඇති විට, ඒ අතරින් අදාළ සේවා ස්ථානයේ පුරප්පාඩුව පිරවීම සඳහා සලකා බලනු ලබන ප්‍රමුඛතා අනුපිලිවෙල පහත පරිදි වේ.

I. අවිවාහක නිලධාරීන්.
II. විවාහක පාසල් යන දරුවන් නොමැති නිලධාරීන්.
III. විවාහක පාසල් යන දරුවන් සිටින නිලධාරීන් යන ප්‍රමුඛතාවය මත තෝරා ගැනීම සිදු කරනු ඇත.

5.3.9 වෘත්තීය සමිතියක සභාපති / ලේකම් / භාණ්ඩාගාරික යන නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ ඇති අනුග්‍රහයන් හිමිවනු ඇත. මෙම නිලතල මහසභා රැස්වීමකදී අනුමත වූ තනතුරු විය යුතුය.

5.3.10 කටුනායක, මත්තල හා රත්මලාන ගුවන් තොටුපොල කාලගුණ විද්‍යා කාර්යාලවල සේවය සඳහා අනුයුක්ත කරනුයේ පළමු පත්වීමේ සිට සේවා කාලය වසර 05 ක් සපිරූ නිලධාරීන් පමණකි. එබැවින් එම ස්ථානවලට ස්ථාන මාරු අයදුම් කළ යුත්තේද පළමු පත්වීමේ සිට තම සේවා කාලය වසර 05 ක් හෝ ඊට වැඩි නිලධාරීන් හෝ නිලධාරිනියන් පමණි.

එසේ වුවද සංඥා අංශයේ සන්නිවේදන රාජකාරී ඉටු කිරීම සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමේදී මෙය අදාළ නොවේ.



ජී.කේ. කරුණානායක
අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

06 වාර්ෂික ස්ථාන මාරු කාලසටහන

| | කාර්යය | දිනය |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටුවීම. | ජූනි මස 01 වන දිනට පෙර |
| 02 | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර කැඳවීම පිළිබඳ දැන්වීම නිකුත් කිරීම. | ජූනි මස 30 වන දිනට පෙර |
| 03 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාල බලධාරියා වෙත ඉදිරිපත් කිරීම. | ජූලි මස 31 වන දින හෝ එදිනට පෙර |
| 04 | අදාල බලධාරියා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුව වෙත භාර දීම. | අගෝස්තු මස 10 වන දිනට පෙර |
| 05 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාල බලධාරියා වෙත ලිඛිතව භාර දීම. | අගෝස්තු මස 31 වන දිනට පෙර |
| 06 | යෝජිත ස්ථාන මාරුවීම් පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම. | සැප්තැම්බර් මස 15 වන දිනට පෙර |
| 07 | ස්ථාන මාරුවීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීම. | සැප්තැම්බර් මස 30 වන දිනට පෙර |
| 08 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම. | ඔක්තෝම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර |
| 09 | අවසන් වාර්ෂික ස්ථාන මාරු වීම් නියෝග නිකුත් කිරීම. | නොවැම්බර් මස 01 වන දිනට පෙර |
| 10 | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම. | ජනවාරි මස 01 වන දින සිට |

6.1 මෙම ස්ථාන මාරු පරිපාටියට අනුකූල වන පරිදි වාර්ෂික ස්ථාන මාරු නියෝගයන් ලැබූ සියලු නිලධාරින් නියමිත දිනයේදී තම රාජකාරි ස්ථාන වෙත සේවය සඳහා වාර්තා කිරීමට වගකීමෙන් බැඳී සිටී.

07 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර

7.1. ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධාරියෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනාවක් ඉදිරිපත් කරන්නේ නම් එම අභියාචනය ආකෘති පත්‍ර ඇමුණුම 03 ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තවද, තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලිවල සහතික කළ පිටපත් එම අභියාචනය සමග ඉදිරිපත් කිරීමට ද ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

7.2 රජයේ නිලධාරියෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් මගින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා හා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙතද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ වගකීම වන්නේය. නිලධාරියාට තම කැමැත්ත පරිදි අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකිය.

7.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීම් නියෝගය අදාල රජයේ නිලධාරියා වෙත ලද දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය.

ඒ.කේ. කරුණානායක
අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

නියමිත කාලය තුළදී නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධාරියෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපි ගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින 15ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වගබලා ගත යුතු වන්නේය. එසේවුවද වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව අභියාචනා අදාළ ලිපි ගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ නොවැම්බර් 15 දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයේ සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචන ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධාරියෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

7.6 ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධාරියෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යවනු ලබන්නේය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත් වන රජයේ නිලධාරියෙකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධි විධාන යටතේ පිහිටුවා ඇති පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

ජී.කේ. කරුණානායක
අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.